# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2108/67 – 2019 පෙබරවාරි 01 වැනි සිකුරාදා – 2019.02.01**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/10/16/2013.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2015.03.12 දින දරන නියෝගයෙන්, බේරුම්කිරීම මගින් විසඳීම සඳහා යොමු කරනු ලැබූ පන්නිපිටිය, දෙපානම, වීර මාවත, අංක 72/4ඒ හි පදිංචි ඒ. එස්. එම්. රුදිගෝ මයා සහ බත්තරමුල්ල, පැලවත්ත, පාර්ලිමේන්තු පාර, අංක 70 පිහිටි කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් මා වෙත ලබාදෙන ලද අංක ඒ 3591 දරන ප්‍රදානය 2018.08.21 දිනැති හා අංක 2085/10 දරන රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලදී.

එම ප්‍රදානය සම්බන්ධයෙන් කාර්මික ආරාවුල් පනතේ 34 වගන්තිය යටතේ බේරුම්කරු විසින් මා වෙත ලබා දී ඇති 2019.01.10 දිනැති අර්ථ නිරූපණය එම පනතේ 18(1) වගන්තිය ප්‍රකාර මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 ජනවාරි මස 23 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

නඩු අංකය : ඒ/3591

දිනය : 2019.01.10

වේලාව : ප.ව. 2.30

බේරුම්කරු - එස්. කාරියවසම් මැතිතුමා ඉදිරිපිට දී ය.

වාර්තා කළේ - එම්. එම්. වී. සුදාරි

ඉල්ලුම්කාර මහතා පැමිණ නැත.

ඉල්ලුම්කරු වෙනුවෙන් නියෝජිත බන්දුග ගමගේ මහතා පැමිණ සිටී.

වගඋත්තරකාර කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය වෙනුවෙන් සහකාර කළමනාකාර (මානව සම්පත්) හසන්ති ජයසුන්දර මහත්මිය, අභ්‍යන්තර විගණක ඉරානි සුරංගිකා, කළමනාකාර පී. ආර්. අයි. පෙරේරා මහතා යන අය පැමිණ සිටී.

ඒ/3591 දරන බේරුම්කරණ ප්‍රධානයේ පවත්නා කරුණු සම්බන්ධයෙන් අර්ථ නිරූපණයක් ලබා ගැනීම සඳහා මෙම නීති කෘත්‍ය අද දින කැඳවන ලදී.

ප්‍රධානයේ සඳහන් (අ) ඡේදයේ සඳහන් කරුණු ක්‍රියාත්මක කොට ඇත.

ප්‍රධානයේ සඳහන් (ආ) ඡේදයේ සඳහන් කරුණු ද ක්‍රියාත්මකකොට දැනට 2018.10.03 වැනි දින සිට නැවත සේවයේ පිහිටුවන ලදී.

ප්‍රධානයේ සඳහා (ඇ) වැඩ තහනම් කරන ලද කාලය සේවා බණ්ඩනයකින් තොර සේ සලකා නැවත සේවයේ පිහිටුවීම (හිඟ වැටුප් සමඟ) යනුවෙන් අදහස් කරන ලද්දේ වැඩ තහනම් කළ දිනය වූ එනම් ඉල්ලුම්කරු වැඩ තහනම් කරන ලද 2010.08.05 දින සිට මෙම බේරුම්කරණ ප්‍රධානය පරිදි ඉල්ලුම්කාර සේවකයා නැවත සේවයෙහි පිහිටු වන දිනය දක්වා කාලය එනම් මෙම තීන්දුව ක්‍රියාත්මක කළ යුතුව ඇති 2018.06.13 දින දක්වා කාලය අදහස් කෙරේ.

මීට අමතරව 2018.06.13 වැනි දින සිට ඉල්ලුම්කරු නැවත සේවයේ පිහිටුවන ලද 2018.10.03 දින දක්වා අදාළ කාල සීමාවට අදාළ හිඟ වැටුප් සඳහා ද ඉල්ලුම්කාර සේවකයාට හිඟ වැටුප් ලැබේ.

ප්‍රදානයේ ඉල්ලුම්කරුට හිමි හිඟ වැටුප් අදාළව ගෙවිය යුතු සේවා නියුක්තීන්ගේ භාරකාර අරමුදල් ද නැගෙනහිර කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ තැන්පත් කරන ලෙසට නියෝග කර ඇතත්, එම මුදල් සේවා නියුක්තීන්ගේ භාරකාර අරමුදල් මණ්ඩලය වෙත භාර කරන ලෙස සේවායෝජක ආයතනයට දන්වා සිටී.

අදාළ හිඟ වැටුප්, අදාළ සේවක අර්ථ සාධක අරමුදල් ප්‍රධානයට අදාළව නැගෙනහිර කම්කරු කාර්යාලයේ තැන්පත් කරන ලෙස දන්වා සිටී.

තව ද, ප්‍රදානයේ ඉල්ලුම්කරුට හිමි විය යුතු සහන යටතේ (ඉ) යටතේ සඳහන් කර ඇති සේවය අත්හිටවපු කාලය සඳහා හිඟ වැටුප් යන්න ඉහත (ඇ) යටතේ සඳහන් කරන 2010.08.05 වැනි දින සිට මෙම ප්‍රදානය මත නැවත සේවයේ පිහිටුවන දිනය දක්වා කාල සීමාව අදහස් කෙරේ. ඊට අමතරව හිඟ වැටුප් වර්ධක ද ඉල්ලුම්කරුගේ සේවය අත්හිටු වන ලද 2010.08.05 වැනි දින සිට මෙම ප්‍රදානම මත නැවත සේවයේ පිහිටුවන දිනය දක්වා වූ කාල සීමාව ඇතුළත් වේ.

මේ අනුව ගෙවීම් කිරීමට වගඋත්තරකාර පාර්ශවයට දන්වමි.

බේරුම්කරු.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.